# උඩවලව ජාතික වනෝද්‍යානය

එස් එම් චන්දිමා දිල්රුක්ෂි*

උඩවලව ජාතික වනෝද්‍යානය වූ කලී වර්තමානය වන විට ශ්‍රී ලාංකේය සංචාරක කර්මාන්තය තුළ විශිෂ්ට මෙහෙවරක් ඉටුකරන්නා වූ සංචාරක ආකර්ෂිතයක් වන අතර, මෙම අධ්‍යයනය තුළින් උඩවලව ජාතික වනෝද්‍යානය හා ඒ ආශ්‍රිත සංචාරක පහසුකම්වල ප්‍රමාණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කරමින් කරුණු ගොනුකරනු ලැබීය. උඩවලව ජාතික වනෝද්‍යානයේ වර්තමාන තත්ත්වය අධ්‍යයනය, මේ කෙරෙහි පවතින සංචාරක ආකර්ෂණය පිළිබඳව අධ්‍යයනය, එහි පවතින සංචාරක පහසුකම් ප්‍රමාණවත්ද යන්න අධ්‍යයනය සහ සංචාරක තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද යන්න ආදිය පිළිබඳව සොයා බැලීම මෙහි ප්‍රධාන අරමුණු විය.

මෙහිදී ප්‍රාථමික සහ ද්විතියික දත්ත උපයෝගී කර ගනිමින් දත්ත රැස් කරනු ලැබීය. ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී සංචාරකයින් සිය දෙනෙකුගෙන් සමන්විත නියැදියක් අහඹු ලෙස තෝරා ගනිමින්, ප්‍රශ්නාවලියක් ලබා දී, ඒ මගින් දත්ත රැස් කරනු ලැබීය. මෙහිදී දේශීය සංචාරකයින් පනස් දෙනෙකු සහ විදේශීය සංචාරකයින් පනස් දෙනෙකු අහඹු ලෙස තෝරා ගනු ලැබීය. ද්විතියික දත්ත රැස් කිරීමේදී අන්තර්ජාලය හා උඩවලව ජාතික වනෝද්‍යානය පිළිබඳව ලියවී ඇති පොත්, සඟරා උපයෝගී කරගනු ලැබීය. මෙම පර්යේෂණය තුළින් උඩවලව ජාතික වනෝද්‍යානයෙහි සංචාරක පහසුකම් සංචාරකයා තෘප්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව නිගමනය කළ හැකි විය. උඩවලව ජාතික වනෝද්‍යානය සංචාරක ආකර්ෂණයට විශාල වශයෙන් නතුකර ගත හැකි ආකර්ෂිතයක් වන අතර එහි සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීම මගින් වැඩි වශයෙන් සංචාරකයින් මේ කෙරෙහි ආකර්ෂණය කර ගත හැකි බව පැහැදිලි වේ.

මුඛ්‍ය පද :- උඩවලව ජාතික වනෝද්‍යානය, සංචාරක පහසුකම්, සංචාරකයින්, ආකර්ෂණය

* කැලණිය විශ්වවිද්‍යාලය, Smcdilrukshi@gmail.com